# <u>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ</u>
# <u>තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී III ශ්‍රේණියේ තනතුරුවලට</u>
# <u>බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම</u>

**1.0** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරී තනතුරු 03ක් සහ සැලසුම් ශිල්පී තනතුරු 01ක් සඳහා නිලධරයන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

**3.0**. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිළධාරින් යටත් විය යුතු වේ.

**4.0** අවශ්‍ය සුදුසුකම්

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම්:-

(I) විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ.) විභාගය එකවර සමත්වීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය සුදුසුකම් 4 (NVQ 4) සම්පූර්ණ කර තිබීම

හා

(II) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ.) විභාගය සමත්වීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය සුදුසුකම් 3 (NVQ 3) සම්පූර්ණ කර තිබීම.

(ඊ) වෘත්තීය සුදුසුකම්:-

(I) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(II) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(IV) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම හෝ

(VI) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම සම්පූර්ණ කර තිබීම හෝ

(VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමානයැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(උ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(ඌ) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ
සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**5.0 වැටුප් පරිමාණය :- රු. 31040/- 10 X 445 – 11 X 660 – 10 X730– 10 X 750 – 57550/-**
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN 3 -2016 වැටුප් කේතය අදාළ වේ.)

**6.0 විභාග පරිපාටිය**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරාගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ. |

**7.0 අයදුම් කිරීමේ ක්‍රමය**

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) විභාග ගාස්තුව රු. 1000/- කි. මෙම විභාග ගාස්තුව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ආදායම් ශීර්ෂයට බැරවන ලෙස පහත ගිණුම් අංකයට යොමු කර නිකුත් කරනු ලබන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි ඇලවිය යුතුය. ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

**බැංකු ශාඛාව - ලංකා බැංකුව, නිදහස් චතුරස්‍ර ශාඛාව**
**ගිණුම් අංකය - 7040712**

(ඇ) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් **2021.04.10** දින හෝ ඊට පෙර **රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර “තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම - 2021” යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

2021 මාර්තු මස 25 දින

**ජේ.ජේ. රත්නසිරි**
**ලේකම්**
**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ**
**තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී**
**III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම - 2021**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

[ ]

ඉල්ලුම් කරනු ලබන තනතුර - [ ] අයදුම්කරන භාෂා මාධ්‍යය - [ ]

කාර්මික නිලධාරි - 1 සැලසුම් ශිල්පී - 2 සිංහල - 1 දෙමළ - 2 ඉංග්‍රීසි - 3

1 මුලකුරු සමඟ නම - ..............................

2 සම්පූර්ණ නම - ..............................
..............................
..............................

3 ජාතික හැඳුනුම්පත් අංකය - [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4 ස්ථිර ලිපිනය - ..............................
..............................
..............................

5 ස්ත්‍රී/ පුරුෂ භාවය - [ ] ස්ත්‍රී - 1 පුරුෂ - 0

6 උපන්දිනය - වර්ෂය [ ][ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

7 දුරකථන අංකය - [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
[ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

8 අධ්‍යාපන සුදුසුකම් -

I අ.පො.ස. (සා/පෙළ) විභාගය -

විභාග අංකය : ..............................

වර්ෂය : .................... මාසය : ....................

| විෂයය | | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

| විෂයය | | ශ්‍රේණිය |
|---|---|---|
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

II අ.පො.ස. (උ/පෙළ) විභාගය -

විභාග අංකය : ..............................

වර්ෂය : .................... මාසය : ....................

| විෂයය | | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

III වෘත්තීය සුදුසුකම් -

| ආයතනය | | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |

9 වෙනත් සුදුසුකම් -

10 විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය -

විභාග ගාස්තු ගෙවූ කාර්යාලය -

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |

11 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

12 අයදුම්කරුගේ සහතිකය :

අ. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ආ. ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

ඇ. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ..............................

..............................

අයදුම්කරුගේ අත්සන

## අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ....................................................................මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ..............................දින මා ඉදිරිපිට දී ඔහුගේ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-

අත්සන :-

තනතුර හා නිලමුද්‍රාව :-

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධරයෙකු, රු.240,360/= වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධරයෙකු විසින් සහතික කර තිබිය යුතුය.)

## රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

...................................................................................................................... මයා/මිය/මෙනෙවිය දැනට ............................................................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ......................................................................වශයෙන් සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඇය/ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

.............................................................

දිනය :-

**දෙපාර්තමේන්තු ප්‍රධානී අත්සන**
**නිලමුද්‍රාව**